*සැ.යු.*- 2019.03.22 දින පළවූ අංක 2116 දරන *ගැසට් පත්‍රයේ* II, III සහ IV (අ) කොටස් පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,117 - 2019 මාර්තු මස 29 වැනි සිකුරාදා - 2019.03.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 894 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 අප්‍රේල් මස 18 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 අප්‍රේල් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

891 - B 81508 — 5,403 (2019/03)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2019**

බලයලත් සැළසුම් ශිල්පියෙකු ලෙස වෘත්තියේ යෙදීමට සර්වේයර් ජනරාල්ගේ සහතික පත්‍රය නිකුත් කිරීම සඳහා වන විභාගය කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කොටස් දෙකකින් සමන්විත වේ.

I වැනි කොටස - බණ්ඩාංක පත්‍ර පිළියෙල කිරීම
II වැනි කොටස - පිඹුරු වැඩ

2. විභාගයේ පළමුවැනි කොටස 2019 ජූලි මස 20 වැනි දින දී ද, දෙවෙනි කොටස 2019 ඔක්තෝබර් මස 19 හා 20 යන දිනයන්හි දී ද පැවැත්වෙනු ඇත. පළමු වැනි කොටසින් අසමත් වන අපේක්ෂකයින්ට දෙවැනි කොටසට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගයේ කොටස් දෙකෙන් ම එකවර සමත් වන අපේක්ෂකයින්, බලයලත් සැළසුම් ශිල්පීන් සඳහා වන සර්වේයර් ජනරාල්ගේ සහතිකය ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

3. විභාගයේ දී, අපේක්ෂකයින්ට පහත සඳහන් දෑ කළ හැකි බවට මා හට ඒත්තු ගැන්විය යුතුය.

(*අ*) ක්ෂෙත්‍ර සටහනක් මගින් බණ්ඩාංක පත්‍රයක් නිවැරදිව පිළියෙල කිරීමට හා පරික්‍රමණයක් බණ්ඩාංක කිරීමට;

(*ආ*) කෝණමානය භාවිතයෙන් හා බණ්ඩාංක ආධාරයෙන් නිවැරදිව පිඹුරක් නියැකීමට හා ක්ෂෙත්‍රඵලය ගණනය කිරීමට.

4. *විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම්;*

(*අ*) ජාතික අධ්‍යාපන සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත්වීම;

*සහ*

(*ආ*) රජයේ කාර්මික විද්‍යාලයක හෝ වෙනත් අර්ධ රාජ්‍ය ආයතනයක, අවුරුද්දකට නොඅඩුවූ කාල සීමාවක් සහිත, සැළසුම් ශිල්පය හා සම්බන්ධ පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

5. *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 800 කි. මෙම මුදල සර්වේයර් ජනරාල් කාර්යාලයේ සරප් කවුන්ටරය වෙත, ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයක් වෙත හෝ දියතලාව, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතන වෙත ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පත්‍රයේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) විභාග ගාස්තුව මුදල් ඇණවුම් හෝ චෙක්පත් මගින් භාරගනු නොලැබේ. රිසිට්පත නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මුද්දර මගින් හෝ චෙක්පත් මගින් කරනු ලබන ගෙවීම් භාරගනු නොලැබේ.

6. *අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :*

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සෙ. මී. 21 x සෙ. මී. 29 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කරන ලද අයදුම්පත්‍රයක්, පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ''බලයලත් සැළසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2019'' යනුවෙන් සඳහන් කරන්න.

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (විභාග)
විභාග අංශය
සර්වේයර් ජනරාල් කාර්යාලය
තැ.පෙ. 506
කොළඹ 05.

දෙන ලද ආදර්ශ අයදුම්පතට අනුකූලව පිළියෙල කර නොමැති අයදුම්පත් ද, නිසි පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ද, *ගැසට්* නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

8. අයදුම්පත් 2019 මැයි මස 24 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. එදිනට පසු එවනු ලබන අයදුම්පත් භාර ගනු නොලැබේ.

9. බණ්ඩාංක පත්‍ර හා ඇඳීම කඩදාසි විභාග ශාලාවේදී සපයනු ලැබේ. කෙසේ වෙතත් අයදුම්කරුවන් විසින් ඇඳීම් උපකරණ ද, බණ්ඩාංක ගණනය කිරීමට අවශ්‍ය ගණිත වගු යනාදිය ද, අවශ්‍ය අනෙකුත් සියලු උපකරණ ද රැගෙන ආ යුතුය. විභාග ශාලාධිපතිගේ අවසරය ඇතිව මෘදුකාංග රහිත සාමාන්‍ය විද්‍යාත්මක ගණක යන්ත්‍ර භාවිතා කිරීමට ඉඩදෙනු ලැබේ.

10. (i) සෑම විභාග අපේක්ෂකයෙකු ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් එකක් ඉදිරිපත් කළ හැකිය.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත;

(ආ) වලංගු ගුවන් ගමන් බලපත්‍රයක්

(ඇ) විභාගය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුලත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරීත්වය යටතේ නිකුත් කරන ලද අයදුම්කරුගේ ඡායාරූපයක් ද සහිත බලපත්‍රයක් හෝ අනන්‍යතා ලියවිල්ලක්.

(ii) ඉහත 10(i) හි පරිදි තමන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

11. මෙම විභාගය මෙට්‍රික් ඒකක ක්‍රමය යටතේ පැවැත්වෙනු ඇත.

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්.

2019 මාර්තු මස 05 වැනි දින,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
තැ.පෙ. 506
කොළඹ 05.

ආදර්ශ අයදුම්පත්‍ර

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

***බලයලත් සැලසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - 2019***

විභාග අංකය [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(අ) (i) මුලකුරු සමග නම : (මයා/මිය/මෙනවිය)
සිංහලෙන් :————.
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම :
සිංහලෙන් :————.
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

(ආ) ස්ත්‍රී/පුරුෂ භාවය :————.
(ඇ) තනතුර :————.
(ඈ) රැකියා ස්ථානයේ ලිපිනය :————.
(ඉ) ස්ථිර ලිපිනය :
සිංහලෙන් :————.
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.
(ඊ) උපන් දිනය :————.
(උ) අධ්‍යාපන සුදුසුකම් (සහතික කරන ලද සත්‍ය පිටපත් අමුණා තිබිය යුතුය.) :————.

(ඌ) විභාගයට පෙනී සිටින මාධ්‍යය : සිංහල/දෙමළ/ඉංග්‍රීසි :————.
(එ) මුදල් ගෙවූ කාර්යාලය :————.
(ඒ) රිසිට්පත් අංකය :————.
දිනය :————.

(ලදුපත මෙහි අලවන්න.)

මවිසින් ඉහතින් දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි තොරතුරු බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

03-1520

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

වෘත්තීය සංවර්ධනය සඳහා ගුරු භවතුන්ට ඇරයුමක්

ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2019/2020

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 28/2016 අනුව සුදුසුකම් සපුරාලන උපාධිධාරී නොවන නුපුහුණු ගුරුවරුන්ගෙන් ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙතෙක් විධිමත් පුහුණුව සම්පූර්ණ නොකළ ගුරුවරුන්/ගුරු සහායකවරුන්, චක්‍රලේඛ අංක 28/2016 අනුව සකසා ගත් අයදුම්පත් 2019 අප්‍රේල් මස 27 දිනට ප්‍රථම ''අධ්‍යාපන අධ්‍යක්ෂ, ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

මෙම චක්‍රලේඛය, අයදුම්පත හා උපදෙස් පත්‍රිකාව අධ්‍යාපන අමාත්‍යාංශ නිල වෙබ් අඩවියෙන් ද (www.moe.gov.lk) ඕනෑම කලාප අධ්‍යාපන කාර්යාලකින් ද ලබාගත හැකිය.

පද්මසිරි ජයමාන්න,
ලේකම්.

අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03-1519

**ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව**

පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා ආධුනිකයින් බඳවා ගැනීම - 2019 ජූලි

ශ්‍රී ලංකා ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන මොරටුව කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයෙහි (IETI) පහත සඳහන් පාඨමාලා හැදෑරීම සඳහා තරුණ තරුණියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

1. පවත්වනු ලබන පාඨමාලා :

| | *පාඨමාලා විස්තර* | *ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)* | *කාලය* |
|---|---|---|---|
| 01,02,03, වෘත්තීන් සඳහා අ.පො.ස (සා.පෙළ) විභාගයේදී ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් සමග අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ගණිතය සහ විද්‍යාව සමග විෂයයන් 06 ක් සමත් වී තිබීම හෝ අ.පො.ස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය හෝ තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන් 2න් එක් විෂයකට සාමාර්ථයක් ලබා තිබීම හා අ.පො.ස. (සා.පෙළ) සිංහල භාෂාව, විද්‍යාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 6 ක් සමත් වී තිබීම. | | | |
| 01. | **ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පී (විශේෂ)**<br>(Basic Work Shop practice, Domestic Electrical Installation, Analog & Digital Electronic, Industrial Electronic, PLC, Micro Controller, ‘‘PIC’’,ARDUINO & project works ) | - | අවු. 03 |
| 02. | **විදුලි කාර්මික ශිල්පී (විශේෂ)**<br>ගෘහස්ත හා කර්මාන්තශාලා විදුලි පරිපථ, විදුලි මිනුම් උපකරණ, ගෘහස්ථ/කර්මාන්තශාලා ආරක්ෂක හා සන්නිවේදන පද්ධති වායු පාලන තාක්ෂණය, PLC තාක්ෂණය, මයික්‍රොකොන්ට්‍රෝලර් ප්‍රෝගැමින් ,ඩිජිටල් ඉලෙක්ට්‍රොනික්ස්, ඔටෝමේෂන් පද්ධති | 4 වන මට්ටම | අවු. 03 |
| 03. | **ඉදිකිරීම් සුපරීක්ෂක**<br>(Construction Management, Surveying & Leveling, Road Construction, Auto Cad, Quantity Surveying, Buliding Drawing & Estimate)<br>ක්ෂේත්‍රයේ දැවැන්ත සමාගම් සමග වැඩබිම් පුහුණුව | 4 වන මට්ටම | අවු. 01 1/2 |
| 04,05, වෘත්තීන් සඳහා අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් සමත් වීම. | | | |
| 04. | **ශීතකරණ හා වායු සැකසුම් කාර්මික ශිල්පී**<br>සියලුම වර්ගයේ ශීතකරණ, ගෘහස්ත හා කර්මාන්තශාලා වායු සමන පද්ධති | 4 වන මට්ටම | අවු. 02 |
| 05. | **යන්ත්‍ර කාර්මික ශිල්පී (විශේෂ)** - Machinist (Special)<br>CNC Programming, CNC Machining, EDM Process, Wire Cutting Process, Laser Cutting, Solid works,Auto Cad | 4 වන මට්ටම | අවු. 03 |
| 06, 07, වෘත්තීය සඳහා අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් සමත් වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම. | | | |
| 06. | **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී** - (ICTT)<br>(Maintain files & folders, Ms Word, Ms Excel, Ms Power Point, Maintain Data Base (Ms Access), Internet & E-mail, Install & Configure operating system, Installation & troubleshooting of Network, Graphic for Web, Design static web pages, System Analysis & Design ) | 4 වන මට්ටම | අවු. 01 |
| 07. | **පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පී**<br>(Adobe Photoshop,Adobe Illustrator,Adobe InDesign, Coral Draw, Printing & Scanning Method) | 4 වන මට්ටම | අවු. 01 |
| 08, 09, 10, 11, වෘත්තීන් සඳහා අවම වශයෙන් අ.පො.ස (සා.පෙළ) දක්වා අධ්‍යාපනය ලැබීම | | | |

| | පාඨමාලා විස්තර | ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) | කාලය |
|---|---|---|---|
| 08. | **පෑස්සුම් ශිල්පී (විශේෂ)** - Welder (Special) (MMA/GAS/TIG/MIG/MAG/FCAW/PLASMA/SPOT/STUD Welding ශිල්පීය ක්‍රම, Destructive & Non Destructive Testing Methods, Plate & Pipe weld) | 4 වන මට්ටම | අවු. 03 |
| 09. | **ජලනල කාර්මික ශිල්පී** දැනට කර්මාන්ත ක්ෂේත්‍රයේ භාවිතා වන PVC, CPVC, GI, PB, PPR හා HDPE නල වර්ග But fusion,Heat fusion, හා Electro fusion වැනි අති නවීන තාක්ෂණික ක්‍රමෝපාය භාවිත කරමින් සම්බන්ධ කිරීම, නවීන සනීපාරක්ෂක උපාංග ස්ථාපනය, ජල පොම්ප ස්ථාපනය, උණුසුම් ජලනල පද්ධති ස්ථාපනය සහ සැලසුම් නිර්මාණය හඳුනාගැනීම සහ ඇස්තමේන්තු සකස් කිරීම | 4 වන මට්ටම | අවු. 02 |
| 10. | **පොත් බඳින්නා** කොළ වර්ග හඳුනා ගැනීම/නැවීම, විවිධ මැහුම් ක්‍රම හඳුනා ගැනීම, පොතක පිටු එකතු කිරීම/ කටු ගැසීම, පිටු අංකනය/ පොත් වයර් කිරීම, පිටු කවර සැකසීම, ලෙජර් පොත මැසීම/ කවරය සෑදීම, පොත් සංරක්ෂණය | 4 වන මට්ටම | අවු. 01 1/2 |
| 11. | **දැව කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ)** දැව සහ සංයුක්ත දැව භාවිතය, දැව මූට්ටු වර්ග, න්‍යායික දැනුම, සැලසුම් නිර්මාණය, ඇස්තුමේන්තුව, නවීන යන්ත්‍ර ආරක්ෂිතව පරිහරණය, යන්ත්‍ර තල මුවහත් තැබීම හා නඩත්තුව, ගෘහ භාණ්ඩ නිමහම් කිරීම | 4 වන මට්ටම | අවු. 02 |

2. වයස : 2019.04.26 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු 35ට නොවැඩි විය යුතුය.

3. *පුහුණුව පිළිබඳ විස්තර :*

3.1 සියලු ම පාඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැළසුම් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණුවේ පළමු භාගයේ දී මූලික පුහුණුව ආයතනය තුළ දී ලබාදේ. පුහුණුවේ දෙවන භාගයේ දී වැඩිදුර පුහුණුව සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ. සියලුම වෘත්තීන් සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් අතිශයින් වැඩි වී ඇත.

4. *තෝරාගැනීමේ ක්‍රමය :*

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්.

5. *අයදුම්පත් එවිය යුතු ආකාරය* :

5.1 පහත දක්වා ඇති ආකෘතියට අනුව, 11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර ගත් හෝ www. naita. gov.lk වෙබ් අඩවියෙන් ලබාගත් ඉල්ලුම්පත් ඔබගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සමග 2019 අප්‍රේල් මස 26 වැනි දිනට පෙර, අධ්‍යක්‍ෂ/විදුහල්පති, කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "ආධුනිකයින් බඳවා ගැනීම 2019 ජුලි" යන්න සඳහන් කළ යුතු අතර, ඔබගේ ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් ඔබගේ ඉල්ලුම්පත සමඟ එවිය යුතුය.

5.2 එක් අයදුම්කරුවෙකු තමන් කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් ඉල්ලුම්පතේ සඳහන් කළ යුතු ය.

5.3 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පූර්ණ කාලීන පාඨමාලාවක් දැනට හදාරන අයට මේ සඳහා අයදුම්කළ නොහැක.

5.4 තැපෑලේ දී නැතිවන හෝ ප්‍රමාදවන අයදුම්පත් සම්බන්ධයෙන් කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය වගකියනු නොලැබේ. ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත කල් ඇතිව ඉදිරිපත් කල යුතුය.

ඉංජිනේරු නසීර් අහමඩ්,
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

ආදර්ශ අයදුම් පත්‍රය (11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ)

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව**

ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත - 2019 ජූලි

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————. මයා./මිය./මෙනෙවිය

2. මුල’කුරු සමග නම :——————.

3. ලිපිනය :——————.

4. පදිංචිය :
   (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————.
   (ii) දිස්ත්‍රික්කය :——————.

5. දුරකථන අංකය : නිවස :——————. ජංගම :——————.

6. උපන් දිනය :——————.

7. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

8. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම X ලකුණින් සළකුණු කරන්න.)

| අ. පො. ස. (උ.පෙළ) | | අ. පො. ස. (සා.පෙළ) | | 8 වන ශ්‍රේණිය | |
|---|---|---|---|---|---|

අ.පො.ස (සා/පෙළ) ප්‍රතිඵල :

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස (උ/පෙළ) ප්‍රතිඵල :

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

9. ඔබගේ සුදුසුකම් අනුව ඔබ විසින් හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් සඳහන් කරන්න.

| | |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරමි.

___________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

03-1465

---

**සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2019 මාර්තු

2014.10.11 වැනි දින හා අංක 1883/17 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් ස්ථිර කිරීමට පෙර හා පූර්වයෙහි මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරක නිලධාරියකු එකී පත්වීම් දින සිට දෙවසරක කාලයක් ඇතුළත සමත් විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2019.04.28 වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාලසටහන ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. *සුදුසුකම්* :

අදාළ විභාගය සම්පූර්ණ කර නොමැති, ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ට සහ පත්වීම ස්ථිර නොකරන ලද දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ට මෙම විභාගයට අයදුම් කළ හැක. තව ද, පූර්වයෙහි මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය නිලධාරීන් පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරකට පත්කර ඇත්නම් එම නිලධාරීන්ට ද මෙම විභාගයට අයදුම් කළ හැක.

03. *අයදුම්පත්* :

මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා වෙත 2019.03.22 වැනි දින හෝ ඊට ප්‍රථම භාර දිය යුතු ය. සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ බවට ආයතන ප්‍රධානීන් විසින් සහතික කරන ලද අයදුම්පත් කොළඹ 10, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශයේ ''සුවසිරිපාය'' අධ්‍යක්ෂ (විභාග) වෙත 2019.03.30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. සෑම අයදුම්පත්‍රයකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය. තම අයදුම්පත සමග රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු. 45.00ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවර දෙකක් (02) ක්ද එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැ. යු* .- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 වර්ගයේ කඩදාසියක පළමු පිටුවේ අංක 1 සිට 4 (ඉ) දක්වාත් දෙවන පිටුවේ අංක 4 (ඊ) සිට අංක 9 දක්වාත් සකස් කළ යුතු ය. ඉහත ආකෘතියට අනුකූල නොවන සහ අසම්පූර්ණ සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. *විභාග ගාස්තු* :

(I) විභාගයට පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25 බැගින් අවලංගු නොකළ මුද්දර අයදුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන සහ දිනය යොදා ඒවා නිසි ලෙස අවලංගු කළ යුතු ය.

(II) කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. *විභාගයට ඇතුළත් කර ගැනීම* :

(I) පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(II) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතු ය. :-

(*අ*) ජාතික හැඳුනුම්පත;
(*ආ*) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත;
(*ඇ*) වලංගු රියැදුරු බලපත්‍රය;
(*ඈ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(III) කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත් නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකිය. එසේ ඔබේ නමට අදාළ විභාග අංකය සහ විභාග මධ්‍යස්ථානය සොයා ගත්තේ නම් ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක් ද සමග වෙබ් අඩවියේ සඳහන්ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරු කර විභාගයට පෙනී සිටිය හැකිය. ප්‍රවේශපත්‍ර ලැබුණු අයදුම්කරුවන් අත්සන සහතික කර රැගෙන පැමිණිය යුතු ය. අත්සන සහතික කරන ලද ලිපිය හෝ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. (වෙබ් අඩවිය-www. health. gov.lk)

06. *විභාග පරිපාටිය* :

මෙම විභාගය ලිඛිත, රචනා ප්‍රශ්න පත්‍ර තුනක් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයක් වශයෙන් කොටස් හතරකින් සමන්විතය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත් වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50ක් ලබා ගත යුතු ය. එක් වරක දී හෝ කිහිපවරක දී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. නිලධාරින් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ දී අදාළ සියලුම විෂයයන්ට පෙනී සිටිය යුතු ය.

07. *විභාග විෂය නිර්දේශ මාලාව* :

07:1 *ලිඛිත විභාගය*

07:1:1 *ආයතන සංග්‍රහය ප්‍රශ්න පත්‍රය*

කාලය පැය 02 යි, ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතු ය.

*විෂය නිර්දේශය* :

(i) සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පොදු රෙගුලාසි

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති හා රෙගුලාසි

(iii) ආයතන සංග්‍රහය ඃ

I කොටස — VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XXIII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXI, XXXII පරිච්ඡේදයන්,

II කොටස — XLVII සහ XLVIII යන පරිච්ඡේදයන්.

07:1:2 රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය ප්‍රශ්න පත්‍රය ඃ

කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතු ය.

*විෂයය නිර්දේශය* :
*සෞඛ්‍ය සේවා සංග්‍රහය* -
(i) රෝහල් හා මහජන සෞඛ්‍ය පරිපාලනය
(ii) රසායනාගාර සේවා කළමනාකරණය
(iii) ඖෂධ කළමනාකරණය

07:1:3 *ගිණුම් ප්‍රශ්න පත්‍රය* :
කාලය පැය 02 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතු ය.

*විෂයය නිර්දේශය* ඃ

(i) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තොග කළමනාකරණය හා ගිණුම්කරණ රෙගුලාසි.
(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලැබූ කළමනාකරණ අත් පොතෙහි මූල්‍ය කොටස.
(iii) වෛද්‍ය නිලධාරීන් සඳහා දෛනික පරිපාලන රාජකාරි සඳහා අදාළවන රාජ්‍ය මූල්‍ය රෙගුලාසි.

| | | |
|---|---|---|
| පරිච්ඡේද I | - | මු. රෙ. 1, 2, 78 |
| පරිච්ඡේද II | - | මු. රෙ. 90, 91, 101, 102, 103, 104, 105, 106, 107, 108, 109, 110, 113, 115, 118, 119 |
| පරිච්ඡේද III | - | මු. රෙ. 124, 125, 126, 127, 128, 131, 133, 134, 135, 136, 137, 138, 139, 140, 142, 143, 151, 152, 154, 155, 156, 189 |
| පරිච්ඡේද V | - | මු. රෙ. 200, 201, 215, 225, 238, 245, 255, 257, 260 |
| පරිච්ඡේද VI | - | මු. රෙ. 380, 381, 382, 383, 384, 385, 386, 388, 389, 390, 391, 392, 393, 394 |
| පරිච්ඡේද VII | - | මු. රෙ. 488, 493 |
| පරිච්ඡේද XIII | - | මු. රෙ. 715, 716, 756, 757, 758 |

*ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය*

1 වැනි පරිච්ඡේදය - සියලුම වගන්ති.
2 වැනි පරිච්ඡේදය - 2.3, 2.4, 2.5, 2.6, 2.7, 2.8
3 වැනි පරිච්ඡේදය - 3.1, 3.2, 3.3, 3.4, 3.5, 3.6, 3.7, 3.8, 3.9

07:2 *සිංහල/දෙමළ වාචික පරීක්ෂණය* :
සිංහල/දෙමළ භාෂා ප්‍රවීනතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙන යාමේ දී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහල මාධ්‍ය නිලධාරීන්ට දෙමළ මාධ්‍යයෙන් ද, දෙමළ මාධ්‍ය නිලධාරීන්ට සිංහල මාධ්‍යයෙන් ද සන්නිවේදනය කිරීමට ඇති හැකියාව

පරීක්ෂා කරනු ලැබේ. කාලය විනාඩි 10කි.

08. *විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම*

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම් ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතු ය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන් ද වැළකී සිටිය යුතු ය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතු ය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයෙහි නියුතු අදාල නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න.

මෙම තොරතුරු www.health. gov.lk වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත.

*සැ. යු.* .- මෙම චක්‍රලේඛයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයන් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.

වසන්තා පෙරේරා,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2019 මාර්තු මස 18 වැනි දින,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය'',
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත

**ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2019 මාර්තු**

01 (*අ*) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.

(iv) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

(*ආ*) I නිළ නාමය (අදාළ කොටුව තුළ ( ✓ ) ලකුණ යොදන්න)

I වෛද්‍ය නිලධාරී ☐ II දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී ☐

II සීමාවාසික පත්වීම ලද දිනය :————.

III ප්‍රාථමික ශ්‍රේණියට / II ශ්‍රේණියට පත්වීම ලද දිනය :————.

02. ඔබ මෙවර විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (✓) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (x) ලකුණ යොදන්න. ඃ

රෝහල් සහ බෙහෙත් ඃ ශාලා පරිපාලනය ☐ ආයතන සංග්‍රහය ඃ ☐ ගිණුම් ඃ ☐

සිංහල වාචික ඃ ☐ දෙමළ වාචික ඃ ☐

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය (අදාළ කොටුවේ ( ✓ ) හරි ලකුණ යොදන්න.) :

සිංහල : ☐ ඉංග්‍රීසි : ☐ දෙමළ : ☐

04. (අ) (i) දැනට සේවය කරන ආයතනය (පැහැදිලිව සඳහන් කරන්න.) :————.

(ii) මෙම ආයතනය අයත් වන්නේ -

රේඛීය අමාත්‍යාංශයට ☐

පළාත් සභාවට ☐

(ආ) (i) පළාත් සභාවට නම් අදාළ පළාත :————.

(ii) එය අයත් දිස්ත්‍රික්කය :————.

(ඇ) ජංගම දුරකතන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

(ඉ) පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමැති විභාග මධ්‍යස්ථානයට අදාළ කොටුවේ ( ✓ ) හරි ලකුණ යොදන්න. (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර, එකී මධ්‍යස්ථානයට අයදුම්කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයකට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.)

| | | | |
|---|---|---|---|
| කොළඹ ☐ | කඳාන ☐ | හම්බන්තොට ☐ | අම්පාර ☐ |
| කළුතර ☐ | ගාල්ල ☐ | බදුල්ල ☐ | වව්නියාව ☐ |
| කුරුණෑගල ☐ | අනුරාධපුර ☐ | රත්නපුර ☐ | පොළොන්නරුව ☐ |
| මහනුවර ☐ | මඩකලපුව ☐ | යාපනය ☐ | ත්‍රිකුණාමලය ☐ |

(ඊ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ රුපියල් 45 ක මුද්දර ඇලවූ ලියුම් කවර 02ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද ? :————.

(උ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන්) :————.
(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද ? :————.
(ආ) විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේ ද? :————.

| මුද්දර කොටුව (මුද්දර අලවා ඒ මත අත්සන තබන්න.) |
|---|

06. *අයදුම්කරුගේ සහතිකය* :

මගේ දැනුම හා විශ්වාසය පරිදි —

(i) මෙම අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්, ප්‍රථම වතාවට නොවන බැවින් රු. ...................... ක්, වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මාගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07. *පෞද්ගලික ලිපිගොනු භාර විෂයය නිලධාරියාගේ/නිලධාරිනියගේ සහතිකය :*

මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණ කර ඇති බවත්, මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

————,
නම සහ අත්සන.

දිනය :————.

08. *ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

........................ මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු වන අතර, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන/නොවන බවට ද රු.................. ක් වටිනා මුද්දර, මෙම මුද්දර අයදුම් පත්‍රයට අලවා ඇති බවද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවට ද මා ඉදිරිපිට දී අත්සන් කළ බවද සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය)

දිනය :————.

09. *විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය :*

........................ මහතා/මහත්මිය/මෙනවිය වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

————,
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය).

දිනය :————.

(අනවශ්‍ය කොටස් කපා හරින්න)

03-1541

---

## අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

### නීති වාර්තා සිංහලට/දෙමළට පරිවර්තනය කිරීමේ ඒකකයේ යතුරු ලේඛක (සිංහල/දෙමළ) තනතුර සඳහා බඳවා ගැනීම - 2019

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ නීති වාර්තා සිංහල/දෙමළ පරිවර්තනය කිරීමේ ඒකකයේ පුරප්පාඩුව පවතින යතුරු ලේඛක (සිංහල - 03/දෙමළ - 03) තනතුරු 06ක් සඳහා බඳවාගැනීමට පහත සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ලේකම්, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''නීති වාර්තා පරිවර්තනය කිරීමේ ඒකකයේ යතුරු ලේඛක (සිංහල/දෙමළ) තනතුර සඳහා බඳවා ගැනීම'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය 2019.04.25 දින වේ.

*සටහන* - ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

01. *පත්වීම ක්‍රියාත්මක කිරීම :*
පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

02. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය.
(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරියෙකු වසර 03ක පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.
(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර

05ක් තුළ දී ලබාගත යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් වසර 03ක් තුළ දී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව වසර 05ක් ඇතුළත ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම යටත් වේ.

03. *බඳවාගැනීමේ ශ්‍රේණිය* - III ශ්‍රේණිය

04. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව MN -1-2016 රු. 27,140-10x300-11x350-10x495-10x660-රු.45,540 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් තලය 2019.01.01 දිනට රු. 24,336 ක් වේ.

05. *සුදුසුකම්* :

(i) *අධ්‍යාපන සුදුසුකම්* :

(අ) මාධ්‍ය භාෂාව/සාහිත්‍ය හා ගණිතය ඇතුළු විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී එක් වාරයකදී අඩුම තරමින් විෂයයන් 05ක් සහිතව විෂයන් 06කින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්වීම

(ආ) අධ්‍යන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ii) වෘත්තීය සුදුසුකම් :
අ.පො.ස. (සා/පෙළ) යතුරු ලියන විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

(iii) *පළපුරුද්ද* :

සිංහල/දෙමළ මිනිත්තුවකට වචන 20ක වේගයෙන් යතුරු ලියනය කිරීමේ හැකියාව

06. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

07. *කායික සුදුසුකම්* :

(i) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවයේ යෙදීමට තරම් යෝග්‍ය වන යහපත් මානසික හා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

(ii) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට තරම් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

08. *වෙනත් සුදුසුකම්* :

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. (සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.)

09. *බඳවා ගැනීමේ ක්‍රමය* :

09.1 *වෘත්තීය පරීක්ෂණය* :

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණය මගින් ලකුණු ලබාදේ.

වෘත්තීය පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙන ක්‍රමය :-

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| යතුරු ලියනය (අඩුම වේගය විනාඩියට වචන 20 බැගින් විනාඩි 20ක් යතුරු ලිවීම) | 100 | 40% |

09.2 *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* :

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබාදෙනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන ක්‍රමය :

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අධ්‍යාපන සුදුසුකම් | 10 | |
| 2. ඉංග්‍රීසි භාෂා හැකියාව | 10 | |
| 3. පරිගණක දැනුම | 15 | 40 |
| 4. පළපුරුද්ද | 40 | |
| 5. වෘත්තීය සුදුසුකම් | 20 | |
| 6. පෞරුෂත්වය | 05 | |

*සටහන :*

වෘත්තීය පරීක්ෂණය සමත් අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සහ වෘත්තීය පරීක්ෂණය යන දෙකෙන්ම ලබාගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

10. ඉල්ලුම් පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කල යුතු අතර, 1-12 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 13-16 තෙක් ශීර්ෂ දෙවන පිටුවටද වන ලෙස ගෙන සකස් කල යුතුය. ඊට අදාල තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුලත් කලයුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාල ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිලිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම් පත මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම් පතට අනුව සැකසිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුනු බව දන්වනු නොලැබේ.

රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරින් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත්‍රය එවිය යුතුය.

11. *විභාග ගාස්තු :*
සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තු ලෙස රු. 300 මුදලක් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ නමට බැරවන සේ 176100199025184 යන ගිණුමට බැර කළයුතු වේ. අදාල කුවිතාන්සියේ මුල් පිටපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ අමුණා එවිය යුතුය.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා අධිකරණ අමාත්‍යාංශයේ නීති වාර්තා සිංහල/දෙමළ පරිවර්තනය කිරීමේ ඒකයෙහි යතුරු ලේඛක (සිංහල/දෙමළ) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදාල වේ.

ආර්. එම්. ඩී. බී. මීගස්මුල්ල,
ලේකම්,
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

2019 මාර්තු මස 07 වැනි දින,

අංකය ................
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

මාධ්‍ය :

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |

(අදාළ කොටුව සළකුණු කරන්න)

**ආදර්ශ අයදුම්පත්‍රය**

***අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය***

නීති වාර්තා පරිවර්තනය කිරීමේ ඒකකය සඳහා කළමනාකාර තාක්ෂණික නොවන බණ්ඩ 02 සේවා ගණයේ යතුරු ලේඛක තනතුර සඳහා බඳවා ගැනීම. (විවෘත) - 2019

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

04. ලිපි ලැබිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(ස්ථිර ලිපිනයත් වෙනස් වේනම් පමණක් සම්පූර්ණ කරන්න)

05. දුරකථන අංකය :————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :————.

07. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

08. උපන් දිනය - වර්ෂය :————. මාසය :————. දිනය :————.

09. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස - වර්ෂ :————. මාස :————. දින :————.

10. ජාතිය :————.

11. විවාහක/අවිවාහක බව :————.

12. අ.පො.ස.(උසස් පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |

13. අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

14. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 05 වන ඡේදයට අනුව සුදුසුකම් -
I. අධ්‍යාපන සුදුසුකම් :————.
II වෘත්තීය සුදුසුකම් :————.
III. පළපුරුද්ද :————.

15. භාෂා ප්‍රවිනතාව - (අදාළ තීරුවේ ✓ ලකුණ යොදන්න)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍ය | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

16. විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සිය ：

| |
|---|
| |

අයදුම්කරුගේ සහතිකය

........................................... වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාව මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කළින් හෙළිවුවහොත් නුසුදුසු කිරීමට යටත් වන බවත්,තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

03-1540

---

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තු නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019

## Open Competitive Examination for Recruitment to the Post of Parliamentary Officer in Parliament of Sri Lanka - 2019

01 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පාර්ලිමේන්තු නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2019 ජූලි මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2019 අප්‍රේල් මස 30 දින වේ.
(ආ) මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැක.

02 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුගේ සිට පුරප්පාඩුව ඇති තනතුරු 09 ක් පිරවීම සඳහා තෝරාගනු ඇත.

පාර්ලිමේන්තුවේ පරිපාලන, ව්‍යවස්ථාදායක සේවා සහ මුදල් හා සැපයුම් කටයුතු සඳහා කළමනාකාරීත්වයට සහාය වීම සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම අපේක්ෂා කරනු ලබයි.

03 *මාසික වැටුප් පරිමාණය.-* 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය රු.34,605-9x660/3x755-42,810/- වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම තනතුරට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 63,000/- ක් පමණ වේ.)

04 බඳවා ගැනීමේ සුදුසුකම් ：

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

(*ආ*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය. ඒ අනුව 1998 අප්‍රේල් 30 දිනට හෝ ඊට පෙර හා 1989 අප්‍රේල් 30 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

(රාජ්‍ය, පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ වසර 10ක සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරීන්ට සහ පාර්ලිමේන්තු මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ සමාජික/ සමාජිකාවන් සඳහා උපරිම වයස් සීමාව අවුරුදු 40 ක් වේ.)

(*ඇ*) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(*ඈ*) පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය ：

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන්

පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් තිබීම;

හෝ

රාජ්‍ය / පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ වසර 10ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

සහ

(ii) දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල හෝ දෙමළ, ඉංග්‍රීසි හෝ ඉංග්‍රීසි සාහිත්‍ය සහ ගණිතය යන විෂයයන් සඳහා සම්මාන සාමර්ථයක් සහිතව විෂයයන් 06කින් අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් වීම.

*සටහන*- ඉහත 4 (ඇ)(ii) හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිතව තම තනතුරෙහි ස්ථිර කර ඇති පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ සාමාජික / සාමාජිකාවන්ට ද මේ සඳහා අයදුම් කළ හැක.

*සැ.යු.* - සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2019 අප්‍රේල් මස 30 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :
ලිඛිත පරීක්ෂණයකින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

06. *විභාග පරිපාටිය* :

(*අ*) ලිඛිත විභාගය :
මෙම විභාගය ඉංග්‍රීසි භාෂාව හා පරිවර්තන හැකියාව සහ සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය මැනබැලීම සඳහා වූ ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර ප්‍රශ්න පත්‍ර දෙකම ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා දෙනු ලැබේ. කෙසේ වෙතත් භාෂා හැකියාව මැනබැලීමේ ප්‍රශ්න පත්‍රයේ ඡේද පරිවර්තනයක් අන්තර්ගත වන බැවින් තමන් විභාගයට මුහුණ දීමට බලාපොරොත්තු වන මාධ්‍යය අයදුම්පතේ සටහන් කිරීමට අයදුම්කරුවන් වගබලා ගත යුතු ය.

| විෂයය | ලකුණු | කාලය | සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| භාෂාව සහ පරිවර්තන කුසලතාව | 100 | පැය 2 | 50% |
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | පැය 2 | 50% |

(1) *භාෂාව හා පරිවර්තන කුසලතාව.*-මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ ඉංග්‍රීසි භාෂා හැකියාව මැනබැලෙන අයුරින් සැකසෙන අවබෝධය, රචනාව, ඡේද සාරාංශ ගත කිරීම, සිංහල / දෙමළ භාෂාවෙන් වූ ඡේදයක් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම, ඉංග්‍රීසි භාෂාවෙන් වූ ඡේදයක් සිංහල / දෙමළ භාෂාවකට පරිවර්තනය කිරීම යන ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(2) *සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය.*-සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රය දේශීය හා විදේශීය ප්‍රවණතා පිළිබඳ දැනුම මැනෙන අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වන අතර එහි දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ස්වාධීන කොමිෂන් සභා, පාර්ලිමේන්තුවේ කාර්යභාරය, යුක්තිය පසිඳලීම, යහපාලන මූලධර්ම වැනි ක්ෂේත්‍රයන් සම්බන්ධව වූ සාමාන්‍ය අවබෝධය මැනබලන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(*ආ*) *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* :

පාර්ලිමේන්තුවේ මහ ලේකම් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අයදුම්කරුවන්ගේ සන්නිවේදන කුසලතා, අමතර අධ්‍යාපන සුදුසුකම්, පරිගණක සාක්ෂරතාව, බාහිර ක්‍රියාකාරකම් සහ නායකත්ව ගුණාංග, පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටියට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහි දී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි.

| | විෂයය ක්ෂේත්‍රය | උපරිම ලකුණු |
|---|---|---|
| 1 | සන්නිවේදන කුසලතා | 20 |
| 2 | අමතර අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 3 | පරිගණක සාක්ෂරතාව | 20 |
| 4 | බාහිර ක්‍රියාකාරකම් සහ නායකත්ව ගුණාංග | 20 |
| 5 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 20 |
| | එකතුව | 100 |

*සටහන* - උත්තර ලිවීමේ දී අත් අකුරු හා අක්ෂර වින්‍යාසය පිළිබඳව සැලකිලිමත් විය යුතු ය.

07. *සේවය නියුක්ත කරලීමේ නියමයන් හා සේවා කොන්දේසි* :

අ. මෙම තනතුර ස්ථිර ය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු ය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර

තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය කරනු ලැබූ පුද්ගලයකු තෝරා ගනු ලැබුවහොත් ඔහු / ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(*ආ*) පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තු මහ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පාර්ලිමේන්තු මහ ලේකම්ට බලය ඇත.

(*ඇ*) පාර්ලිමේන්තු නිලධාරි තනතුර සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් පරිවාස / වැඩ බලන කාල පරිච්ඡේදයේ පළමු වසර තුළ දී පරිගණක භාවිතය පිළිබඳව දැනුමක් ලබා ගත යුතු අතර, වදන් සැකසුම් පැකේජය (MICROSOFT WORD) භාවිතයෙන් විනාඩි 25 කදී වචන 250ට නොඅඩු ඉංග්‍රීසි ලිපියක් සහ විනාඩි 25 කදී වචන 150 ට නොඅඩු සිංහල / දෙමළ ලිපියක් සකස් කිරීමේ හැකියාව ලබා ගත යුතු වේ.

(*ඈ*) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළවන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(*ඉ*) තෝරාගනු ලබන අයදුම්කරුවන්, වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ඔහුගේ / ඇයගේ වැටුපෙන් රජය විසින් තීරණය කරනු ලබන ප්‍රතිශතයකින් දායකත්වය ලබා දිය යුතුය.

(*ඊ*) තෝරාගත් අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය යුතුය.

(*උ*) තෝරාගත් අයදුම්කරුවන් පත්කිරීමට පෙර ඔහු/ඇය පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ වාර්තාවක් ලබා ගැනීමද සිදු කරනු ඇත.

(*ඌ*) රාජ්‍ය, පළාත් රාජ්‍ය කළමණාකාර සහකාර සේවයට අයත් අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ආයතන ප්‍රධානීන් හරහා එවිය යුතුය.

08. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* :

ඉල්ලුම් පත්‍රය පිරවීම් දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

09. *විභාග ගාස්තු* :

විභාග ගාස්තුව රු. 1,200/- කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් / උප තැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පමණක් ගෙවිය යුතුය. අයදුම්කරුවන් නමින් ලබාගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, වෙනත් විභාගයකට මාරු කිරීමද සිදු නොකෙරේ. තව ද මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

10. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(*අ*) අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2" x 12" (A4) ප්‍රමාණයේ කඩදාසි දෙකක සකස් කළ යුතුය. අංක 01 සිට 03 තෙක් වන ශීර්ෂ අයදුම්පත් කඩදාසියේ පළමුවන පිටුවේද අංක 04 සිට 06 තෙක් එහි දෙවන පිටුවේද අංක 07 සිට 10 දක්වා තෙවන පිටුවේද වන පරිද්දෙන් තම අයදුම්පත්‍ර සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත් සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(*ආ*) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(ඈ) අයදුම්පත බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පාර්ලිමේන්තු නිලධාරි තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය - (2019)" යන්න සඳහන් කළ යුතුය.

(ඈ) සම්පූර්ණ කරන ලද අයදුම්පත 2019 අප්‍රේල් මස 30 වන දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික සහ විදේශ) විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503,
කොළඹ.

11. *විභාගයට පෙනී සිටීම* :-

(අ) අයදුම්පතක් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පුවත්පත්වල හා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් අකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත. තව ද, විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) අයදුම්පතේ ද විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු / විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු සාමදාන විනිශ්චකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය. තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු අතර එසේ පෙනී සිටින පළමු අවස්ථාවේදීම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

(ඇ) *විභාග ප්‍රතිඵල* :

මෙම නිවේදනයේ 06 ඡේදයේ සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයට පෙනී සිට සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලිඛිත පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණවලින් ලබාගත් මුළු ලකුණු එකතුව මත කුසලතා අනුපිළිවෙල අනුව ප්‍රතිඵල ලේඛනය සකස් කරනු ඇත. ලිඛිත විභාගයේ ප්‍රතිඵල ලේඛනය පාර්ලිමේන්තුවේ මහලේකම්ට ලබාදීමෙන් අනතුරුව ලිඛිත පරීක්ෂණයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

12. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. :

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු රියැදුරු බලපත්‍රය.

13. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

14. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඩබ්ලිව්. බී. ඩී. දසනායක,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2019 මාර්තු මස 29 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ආදර්ශ අයදුම්පත

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පාර්ලිමේන්තු නිලධාරී තනතුරට**
**බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019**

Open Competitive Examination for Recruitment to the Post of Parliamentary Officer in Parliament of Sri Lanka - 2019

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.0 1.1 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.2 සම්පූර්ණ නම :————.
(සිංහලෙන් / දෙමළෙන්)

1.3 ජාතික හැඳුනුම්පත් අංකය :

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන් / දෙමළෙන්) :————.

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

3.0 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 ජංගම දුරකථන අංකය :

3.3 උපන් දිනය :
වර්ෂය : මාසය : දිනය :

3.4 සුදුසුකම් සැපිරිය යුතු දිනට වයස :

අවුරුදු : මාස : දින :

4.0 *අධ්‍යාපන සුදුසුකම් :*

4.1 *අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර :*

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 *අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර :*

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

4.3 *උපාධිය පිළිබඳ විස්තර :*

(i) උපාධිය ලද දිනය :————.
(ii) විශ්ව විද්‍යාලය / ආයතනය :————.
(iii) උපාධිය :————.
(iv) විෂයයන් :————.

5.0 *වෙනත් සුදුසුකම් :* ......................................................................................................
......................................................................................................
......................................................................................................

6.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ ✓ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් නැත

......................................................................
......................................................................
......................................................................
......................................................................

7.0 *විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :*

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : ..................................
(ii) ලදුපත් අංකය හා දිනය : ..................................
(iii) ගෙවූ මුදල : ..................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

8.0 *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම අයදුම්පතේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලු ම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ........................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10.0 *ආයතන ප්‍රධානියාගේ සහතිකය :* (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................................................................මහතා / මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ........................................... ලෙස සේවය කරන අතර, ඔහුගේ / ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකි ය.

————,
(ආයතන ප්‍රධානියාගේ අත්සන).

නම :————.
තනතුර :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

03-1550

## අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

### බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, II වන පෙළ ජේලර් හා II වන පෙළ පුනරුත්ථාපන නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2019 වර්ෂය**

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින II පෙළ ජේලර් (කාන්තා/පිරිමි) හා II පෙළ පුනරුත්ථාපන නිලධාරී (කාන්තා/පිරිමි) තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ජේලර් (කාන්තා/පිරිමි) II වන පෙළ හා පුනරුත්ථාපන නිලධාරි (කාන්තා/පිරිමි) II වන පෙළ තනතුර සඳහා වේ.

02. *ලිඛිත විභාගය* :- මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විත වේ.

I. බුද්ධි පරීක්ෂණය
II. සාමාන්‍ය දැනීම
III. ගණිතය

02. විභාග දිනය සහ විභාගය පැවැත්වීම :-

මෙම විභාගය 2019 ජුනි මස උපලේඛනය - 1 හි දැක්වෙන දිවයින පුරා පිහිටි ප්‍රධාන නගරවලදී පැවැත්වෙනු ඇත. දක්වා ඇති උපලේඛනයේ සඳහන් නගර අතරින් විභාගය සඳහා පෙනී සිටීමට අපේක්ෂිත නගරය, අංකය සමග පැහැදිලිව දැක්විය යුතුය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. එහෙත් කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් අයදුම්කර නොමැති වුවහොත්, අයදුම්කරු විසින් අයදුම්පතේ දෙවන තේරීම යටතේ සඳහන් කර ඇති නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත ඔවුන් යොමු කරනු ඇත. යෝජිත නගර සියල්ලෙහි ම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් අයදුම්කර නොමැති වුවහොත් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමටත් විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු යොදනු ඇත.

*උපලේඛනය - 1*

| *ප්‍රධාන නගර හා අංක* | |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |

| *ප්‍රධාන නගර හා අංක* | |
|---|---|
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

03. පත් කරනු ලබන මුළු පුරප්පාඩු සංඛ්‍යාව 97 කි. [II වන පෙළ ජේලර් (පිරිමි) - 69, II වන පෙළ ජේලර් (කාන්තා) - 10 , II වන පෙළ පුනරුත්ථාපන නිලධාරි (පිරිමි) -15, II වන පෙළ පුනරුත්ථාපන නිලධාරි (කාන්තා) - 03කි.] අවසාන පුරප්පාඩුව සඳහා හෝ පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

04. සේවා කොන්දේසි :

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලටද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලටද, යටත්ව අපේක්ෂකයකු අදාළ තනතුරේ II වන පෙළ ජේලර් / II වන පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරට පත්කරනු ලැබේ.

4.2 මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

4.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. II වන පෙළ ජේලර් / II වන පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ද, තනතුරට පත්ව වසර 07 ක් ඇතුළත දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ද සමත් විය යුතුය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ප්‍රදේශයක රාජකාරි භාර ගැනීමට ප්‍රතික්ෂේප කරන හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත. II වන පෙළ ජේලර් / II පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරු සඳහා පත්වීම් ලබන්නන් පත්වීම් ලැබ මුල් වසර 05 ස්ථිර පදිංචි ප්‍රදේශයෙන් බැහැර බන්ධනාගාරවල තනිකඩ නිල නිවසේ රැඳී සේවයේ නිරත වන බවට එකඟ විය යුතුය.

05. මාසික වැටුප් පරිමාණය :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි RS - 3/2016 (පියවර 1) වැටුප් බණ්ඩය අදාළ වේ. එම වැටුප් බණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ. :-
රු. 32790 - 7 x 370 - 2 x 495 - 25 x 660 - 52870 (මාසික)
(2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි රු. 32790/- ට අනුරූපී ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ).

06. බඳවා ගැනීමේ සුදුසුකම් :

(අ) (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.
(iv) අවම උස අඩි 5 අඟල් 4
(v) පපුව හුස්ම නාල්ලා අඟල් 32ට නොඅඩු විය යුතුය.(කාන්තාවන් සඳහා අදාළ නොවේ.)
(vi) චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම, ඉහත තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස (උසස් පෙළ) විභාගයේ දී සියලු විෂයන්ගෙන් එකවර සමත්ව තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර) පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් 03කින් එකවර සමත් වී තිබීම.

සහ

සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය/වාණිජ අංක ගණිතය යන විෂයයන් දෙක ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස.(සා/පෙ) විභාගයෙන් විෂයයන් 06 ක් සමත් වීම. (එකවර විෂයයන් 05කට නොඅඩු සංඛ්‍යාවකින් සමත් විය යුතුය.)

හෝ

පළමුවන භාෂාව, ගණිතය යන විෂයයන් දෙක ඇතුළුව විෂයන් 4කට බී ශ්‍රේණියේ සාමර්ථ්‍යයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් ජා.පො.අ.ස. විභාගය සමත් වීම. (එකවර විෂයයන් 05 කට නොඅඩු සංඛ්‍යාවකින් සමත් විය යුතුය.)

හෝ

භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස.(සා.පෙ) විභාගය සමත්වීම. (එකවර විෂයයන් 05 කට නොඅඩු සංඛ්‍යාවකින් සමත් විය යුතුය.)

(ඇ) *වෙනත් සුදුසුකම් :*

II වන පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරට බඳවා ගැනීමේ දී ශ්‍රී ලංකා සමාජ සංවර්ධන ආයතනයේ වෘත්තීය සමාජ වැඩ ඩිප්ලෝමාව ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(ඈ) *වයස :*

- II වන පෙළ ජේලර් - අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2001.04.22 දිනට හෝ ඊට පෙර හා 1974.04.22 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.) (දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
- II පෙළ පුනරුත්ථාපන නිලධාරී - අවු. 24 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 1995.04.22 දිනට හෝ ඊට පෙර හා 1974.04.22 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.) (දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(ඉ) *සුදුසුකම් පිළිබඳ සීමාවන්* :

මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

07. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 600/- කි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20 - 03 - 02 - 13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් / උප තැපැල් කාර්යාලයක් හෝ දිස්ත්‍රික් /ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරු නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයකට මාරු කිරීමක් නොකෙරේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

08. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

8.1 ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආකෘතියට අනුකූල විය යුතුය. එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8.27 " x 11.69" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් සිය අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද හෝ යතුරු ලියනය කරන ලද හෝ අයදුම්පත් ද, භාවිත කළ හැකිය. ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවට ද, 06 සිට 11 තෙක් දෙවන පිටුවට ද, ඉතිරිය 03 වන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) තවද සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත.

8.2 ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන මාධ්‍යයෙන්ම විය යුතුය.

8.3 සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර 2019.04.22 දින හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ"II වන පෙළ ජේලර් /II වන පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - (2019) " යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ. තනතුරු දෙක (02) සඳහාම අයදුම් කරන්නේ නම් එකම අයදුම්පතක් මගින් අයදුම් කළ හැකිය.

8.4 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත, නියමිත විභාග ගාස්තු ගෙවා, නියමිත දිනට හෝ එදිනට පෙර හෝ නිවැරදිව ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනීසිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

8.5 ඉල්ලුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයකු නම් ආයතන ප්‍රධානියා විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය. දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් ස්වකීය ඉල්ලුම් පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. මෙවැනි නිලධාරියකු තෝරා ගතහොත් දැනට සේවය කරන ආයතනයෙන් මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානියා තහවුරු කර තිබිය යුතුය.

8.6 නියමිත දිනට විභාග ගාස්තු ගෙවා නොමැති හා අසම්පූර්ණ තත්ත්වයේ පවතින ඉල්ලුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. තැපැල් කිරීමේ දී ඉල්ලුම් පත්‍රයක් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.7 ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතුය. ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ඔබගේ ඉහත විස්තර ඇතුළත් ලිපියක් ෆැක්ස් මගින්, විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන්කොට එම දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම ද සුදුසු වේ. එහිදී අවශ්‍ය තොරතුරු සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් ඉල්ලුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානම්කොට ළඟ තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

09. විභාගයට ඇතුළුවීම :

(අ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට ඉදිරිපත් වීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට / ඇයට සිදු වනු ඇත.

10. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු රියදුරු බලපත්‍රය.

11. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :

අයදුම්පත් පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු /ඇය ගේ පත්වීම අහෝසි කිරීමට කටයුතු කෙරේ.

12. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ.
(ආ) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

13. බඳවා ගැනීමේ ක්‍රමය :

*ලිඛිත විභාගය* :

මෙම දැන්වීමේ 02 ඡේදයේ සඳහන් විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර 03කින් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක් විෂයයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40%ක් බැගින් ලබා ගත යුතුය. අපේක්ෂකයින් විසින් සියලු ප්‍රශ්නපත්‍ර සඳහා පෙනී සිටිය යුතු වේ.

විෂයයන් : 1. බුද්ධි පරීක්ෂණය
2. සාමාන්‍ය දැනීම
3. ගණිතය

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* :

(i) ඉහත අංක 06 හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳව සීමාවන්ට අනුකූලද යන්න පරීක්ෂා කිරීම සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයට ලකුණු 40%කට නොඅඩුව ලබා ගන්නා අපේක්ෂකයින් වැඩිම ලකුණු ලබාගන්නා අපේක්ෂකයින්ගේ නම් අකාරාදී පිළිවෙලට සකස් කර, පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් ගුණයක් (05) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

***සැලකිය යුතුයි*** :- සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

14. ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

(*අ*) *බුද්ධි පරීක්ෂණය* - කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි. අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වයත්, සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ මාදිලියේ හා කෙටි පිළිතුරු අපේක්ෂිත මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වනු ඇත. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(*ආ*) *සාමාන්‍ය දැනීම* - කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි. තොරතුරු තාක්ෂණය, අපේක්ෂකයා වාසය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද ජාතිකව හා අන්තර්ජාතිකව වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක කාර්මික සංවර්ධනය ද සම්බන්ධයෙන් ඇති ඔහුගේ දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ පොදු ප්‍රශ්න පත්‍රයකි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ මාදිලියේ හා කෙටි පිළිතුරු අපේක්ෂිත මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වනු ඇත. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(*ඇ*) *ගණිතය* - කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි.

- I වෙනි කොටස - එකතු කිරීමේ හැකියාව මැන බැලීම සඳහා ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය හැකි ආකාරයට ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.
- II වෙනි කොටස - ගණනය කිරීමේ හැකියාව මැන බැලීම සඳහා, අනිවාර්යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ගණිතමය ගැටලු විසඳන ප්‍රශ්න හයකින් යුක්තය.

15. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

16. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

17. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් පවතී නම්, සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතුය.

ටී. එම්. ජේ. ඩබ්. තෙන්නකෝන්,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 25 වැනි දින,
බන්ධනාගාර මූලස්ථානය,
අංක 150,
බේස්ලයින් පාර,
කොළඹ 09.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, II වන පෙළ ජේලර් හා II වන පෙළ පුනරුත්ථාපන නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2019

Open Competitive Examination for the Recruitment of Jailor, Class II and Rehabilitation Officer, Class II in the Department of Prisons in Sri Lanka - 2019

| | නගරය | නගර අංකය |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

(ගැසට් නිවේදනයේ 02 වන ඡේදයට අනුව විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය වචනයෙන් සහ අදාළ නගර අංකය සඳහන් කරන්න)

ඉල්ලුම් කරන තනතුර :

II වන පෙළ ජේලර් - 1
II වන පෙළ පුනරුත්ථාපන නිලධාරි - 2
තනතුරු දෙකටම - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ)

01. (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : (GUNAWARDHANA, M. G. B. S. K.)
(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. (අ) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
(ආ) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ) :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී - 1, පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. දුරකථන අංකය : ජංගම

ස්ථාවර

06. විවාහක / අවිවාහක බව :

අවිවාහක - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

විවාහක - 2

07. උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

08. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස (2019.04.22) :

අවුරුදු : මාස : දින :

09. පුරවැසිභාවය (පරම්පරාවෙන් ද/ලියාපදිංචි කිරීමෙන් ද යන වග) :————.

10. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස.(සා.පෙළ)

(i) විභාගයේ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාග ප්‍රතිඵල :-

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස.(සා.පෙළ)

(i) විභාගයේ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාග ප්‍රතිඵල :-

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස.(උ.පෙළ) විභාගය :

(i) විභාගයේ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාග ප්‍රතිඵල :————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

11. වෙනත් සුදුසුකම් : ...........................................................................................................
...........................................................................................................
...........................................................................................................
...........................................................................................................

12. කිසියම් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියේ වරදකරු වී ඇත්නම් ඒ හා සම්බන්ධ සියලුම විස්තර :- ......................................
...........................................................................................................
...........................................................................................................

13. විභාග ගාස්තු ගෙවීම :

i. ගෙවන ලද මුදල :————.
ii. ගෙවූ කාර්යාලය :————.
iii. ගෙවූ දිනය :————.
iv. ලදුපත් අංකය :————.

ලදුපත එක් දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

14. අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍යවන බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ............ හා ............ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

15. අත්සන සහතික කිරීම : (*ගැසට්* නිවේදනයේ 9.4 පරිදි විය යුතුය.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ....................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සහතික කරන්න.)

16. දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියාගේ සහතිකය (දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් සඳහා පමණි.):

....................... මයා/මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ සේවයේ නියුතු බව ද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බව ද, මෙම තනතුරට අදාළ නිවේදනයේ පරිදි මෙම තනතුරට අයදුම් කිරීමට සුදුසුකම් සපුරා

ඇති බව ද, ඔහු/ඇය තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද ප්‍රකාශ කරමි.
(අදාළ නොවන වචන කපා හරින්න)

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සහතික කරන්න)

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

03 - 1555/2

---

**අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**
**බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින බන්ධනාගාර නියාමක (කාන්තා/පිරිමි) තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තු පොලිස් හා අනිකුත් නියාමන සේවා ගණයේ බන්ධනාගාර නියාමක තනතුර සඳහා වේ.

02. *ලිඛිත විභාගය* :- මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.
(i) සාමාන්‍ය බුද්ධිය
(ii) සාමාන්‍ය දැනීම

***සැලකිය යුතුයි*** :- ලිඛිත විභාගයෙන් සමත් වන අයදුම්කරුවන් මෙම දැන්වීමේ 13 වගන්තියේ (1) , (2) හා (3) අනු වගන්ති මඟින් දැක්වෙන ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට සිදුවේ. එබැවින් එකී වගන්තිවල සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන් පමණක් අයදුම් කිරීම අපේක්ෂා කෙරේ.

02. *විභාග දිනය සහ විභාගය පැවැත්වීම* :
මෙම විභාගය 2019 ජූනි මස උප ලේඛනය - 1 හි දැක්වෙන දිවයින පුරා පිහිටි ප්‍රධාන නගරවල දී පැවැත්වෙනු ඇත. දක්වා ඇති උප ලේඛනයේ සඳහන් නගර අතරින් විභාගය සඳහා පෙනී සිටීමට අපේක්ෂිත නගරය, අංකය සමග පැහැදිලිව දැක්විය යුතුය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එහෙත් කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් අයදුම්කර නොමැති වුවහොත්, අයදුම්කරු විසින් අයදුම්පතේ දෙවන තේරීම යටතේ සඳහන් කර ඇති නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත ඔවුන් යොමු කරනු ඇත. යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් අයදුම්කර නොමැති වුවහොත් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමටත් විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු යොදනු ඇත.

උපලේඛනය - 1

| ප්‍රධාන නගර හා අංක | |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවර එළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

03. පත් කරනු ලබන මුළු පුරප්පාඩු සංඛ්‍යාව 1178 කි. [ බන්ධනාගාර නියාමක (පිරිමි) - 1068, බන්ධනාගාර නියාමක (කාන්තා) - 110 අවසාන පුරප්පාඩුව සඳහා හෝ පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

04. *සේවා කොන්දේසි* :

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, යටත්ව අපේක්ෂකයකු අදාළ තනතුරේ බන්ධනාගාර නියාමක තනතුරට පත්කරනු ලැබේ.

4.2 මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට

/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

4.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. බන්ධනාගාර නියාමක තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ප්‍රදේශයක රාජකාරි භාර ගැනීමට ප්‍රතික්ෂේප කරන හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත. බන්ධනාගාර නියාමක තනතුර සඳහා පත්වීම් ලබන්නන් පත්වීම් ලැබ මුල් වසර 05 ස්ථිර පදිංචි ප්‍රදේශයෙන් බැහැර බන්ධනාගාරවල තනිකඩ නිල නිවසේ රැඳී සේවයේ නිරත වන බවට එකඟ විය යුතුය.

05. *මාසික වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි RS. - 1-2016 (පියවර 1) වැටුප් බණ්ඩය අදාළ වේ. එම වැටුප් බණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ. :-

රු. 29,540/ - 7 x 300 - 27 x 370 - රු. 41,630/- (මාසික)

(2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි රු. 29,540/- ට අනුරූපී ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ.)

06. *බඳවා ගැනීමේ සුදුසුකම්* :

(*අ*) (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ii) මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් ද යුක්ත අයවලුන් විය යුතුය. එය පොලිස් නිශ්කාෂණ වාර්තාවක් මගින් සනාථ කර ගැනීමට කටයුතු කෙරේ.

(iii) චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම ඉහත තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය.

(iv) අවම උස අඩි 5 අඟල් 4 (පිරිමි)

(v) අවම උස අඩි 5 අඟල් 2 (කාන්තා)

(vi) පපුව හුස්ම නාල්ලා අඟල් 32ට නොඅඩු විය යුතුය. (කාන්තාවන් සඳහා අදාළ නොවේ)

(vii) අවිවාහක විය යුතුයි. (දික්කසාද වූවන් හා වැන්දඹුවන් මේ සඳහා විවාහකයන් සේ සලකනු ලැබේ.)

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම්* :

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව විෂයයන් හයක් (06) කවර හෝ විෂයයන් දෙකකට (02) සම්මාන සාමර්ථ සහිතව සමත් වී තිබීම.

(*ආ*) *වයස* :

- අවු. 18 ට නොඅඩු හා අවු. 33 ට නොවැඩි විය යුතුය.
(ඒ අනුව 2001.04.22 දිනට හෝ ඊට පෙර හා 1986.04.22 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත)

(*ඇ*) සුදුසුකම් පිළිබඳ සීමාවන් :

මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

07. *විභාග ගාස්තු* :

විභාග ගාස්තුව රු. 600/- කි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20 - 03 - 02 - 13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් / උප තැපැල් කාර්යාලයක් හෝ දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරු නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයකට මාරු කිරීමක් නොකෙරේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

08. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

8.1 ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආකෘතියට අනුකූල විය යුතුය. එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8.27 " x 11.69" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් සිය අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද හෝ යතුරු ලියනය කරන ලද හෝ අයදුම්පත් ද භාවිත කළ හැකිය. ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවට ද 06 සිට 11 තෙක් දෙවන පිටුවට ද ඉතිරිය 03 වන පිටුවටද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) තවද සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත.

8.2 ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන මාධ්‍යයෙන්ම විය යුතුය.

8.3 සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර 2019.04.22 දින හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - (2019) " යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද , දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

8.4 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත, නියමිත විභාග ගාස්තු ගෙවා, නියමිත දිනට හෝ එදිනට පෙර හෝ නිවැරදිව ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. තරග විභාග යට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

8.5 ඉල්ලුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයකු නම් ආයතන ප්‍රධානියා විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය. දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරින් ස්වකීය ඉල්ලුම් පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. මෙවැනි නිලධාරියකු තෝරා ගතහොත් දැනට සේවය කරන ආයතනයෙන් මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානියා තහවුරු කර තිබිය යුතුය.

8.6 නියමිත දිනට විභාග ගාස්තු ගෙවා නොමැති හා අසම්පූර්ණ තත්ත්වයේ පවතින ඉල්ලුම් පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. තැපැල් කිරීමේදී ඉල්ලුම් පත්‍රයක් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.7 ඉල්ලුම් පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතුය. ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ඔබගේ ඉහත විස්තර ඇතුළත් ලිපියක් ෆැක්ස් මගින්, විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන්කොට එම දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම ද සුදුසු වේ. එහිදී අවශ්‍ය තොරතුරු සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානම්කොට ළඟ තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

09. *විභාගයට ඇතුළුවීම* :

(අ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතු ය. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට ඉදිරිපත් වීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට / ඇයට සිදු වනු ඇත.

10. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාව*.-

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු රියැදුරු බලපත්‍රය

11. *සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම්* :

අයදුම්පත් පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු /ඇය ගේ පත්වීම අහෝසි කිරීමට කටයුතු කෙරේ.

12. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය* .-

(*අ*) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ.
(*ආ*) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

13. බඳවා ගැනීමේ ක්‍රමය .-

(1) ලිඛිත විභාගය .-

මෙම දැන්වීමේ 02 ඡේදයේ සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර 02 කින් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක් විෂයයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් බැගින් ලබා ගත යුතු ය. අපේක්ෂකයින් විසින් සියලු ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු වේ.

විෂයයන් : 1. සාමාන්‍ය බුද්ධිය
2. සාමාන්‍ය දැනීම

- ලිඛිත විභාගයේ විෂය නිර්දේශය .-

(*අ*) සාමාන්‍ය බුද්ධිය - කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි. සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් ආශ්‍රයෙන් සිතීමේ තර්කානුකූලභාවය, සිතීමේ විශ්ලේෂණ කුසලතාව, නිර්ණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

(*ආ*) සාමාන්‍ය දැනීම - කාලය පැය 02 කි. මුළු ලකුණු 100 යි. ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ආශ්‍රයෙන් වැදගත්වන කරුණු ඇතුළත් දැනුම පරීක්ෂා කිරීම සඳහා බහුවරණ ක්‍රමයට සැකසූ ප්‍රශ්න පත්‍රයකි.

(2) *ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය*.-

පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයක් ලිඛිත විභාගයෙන් ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන්ගේ නම් අකාරාදී පිළිවෙළට විභාග කොමසාරිස් ජනරාල් වෙතින් ගෙන්වා ගෙන එම අයදුම්කරුවන් සඳහා පමණක් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයක් *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

පිරිමි - මීටර් 1000 (1km) මිනිත්තු 03 තත්පර 44 ක කාලයක් තුළ දිවීම.
කාන්තා - මීටර් 400 (0.4km) මිනිත්තු 02 තත්පර 05 ක කාලයක් තුළ දිවීම.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් යෝග්‍යතා පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලැබේ.

(3) *යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය.-*

(i) ඉහත අංක 06 හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේ ද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳව සීමාවන්ට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම සඳහා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) පහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ලකුණු ලබා දීම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ඇත.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | 25 | අදාළ නොවේ. |
| වෘත්තීය සුදුසුකම් | 15 | |
| ක්‍රීඩා කෞශල්‍යය | 30 | |
| නායකත්ව හා ප්‍රජා සේවාවන් | 25 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

(iii) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් පමණක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කෙරේ. මූලික සුදුසුකම් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ම පරීක්ෂා කරනු ලැබේ. (ලිඛිත විභාගයේ දී අයදුම්කරුවන් ලබාගත් ලකුණු මෙම අවස්ථාවේ දී කැඳවනු නොලැබේ.)

(iv) යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී එක් එක් අයදුම්කරුවන් ලබාගත් ලකුණු නැවත විභාග කොමසාරිස් ජනරාල් වෙත යැවීමෙන් පසු එම අපේක්ෂකයන් ලිඛිත විභාගයේ දී සහ යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් මුළු ලකුණු එකතුව මත පිළිවෙළින් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් නියාමක තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

**සැලකිය යුතුයි** :- සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

❖ කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

❖ මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

❖ මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් පවතී නම්, සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය.

ටී. එම්. ජේ. ඩබ්. තෙන්නකෝන්,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 25 වැනි දින,
බන්ධනාගාර මූලස්ථානය,
අංක 150,
බේස්ලයින් පාර,
කොළඹ 09.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019
Open Competitive Examination for the Recruitment to the Post of Prison Guard - 2019

| | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

(*ගැසට්* නිවේදනයේ 02 වන ඡේදයට අනුව විභාගයට පෙනී සිටීමට
අපේක්ෂා කරන නගරය වචනයෙන් සහ අදාළ නගර අංකය සඳහන් කරන්න.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

01. (*අ*) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*ආ*) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: (GUNAWARDHANA, M. G. B. S. K.)
(*ඇ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. (*අ*) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ) :————.
(*ආ*) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී - 1, පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. දුරකතන අංකය : ජංගම

ස්ථාවර

06. විවාහක / අවිවාහක බව :

අවිවාහක - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විවාහක - 2

07. උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

08. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස (2019.04.22) :

අවුරුදු : මාස : දින :

09. පුරවැසිභාවය (පරම්පරාවෙන් ද / ලියාපදිංචි කිරීමෙන්ද යන වග) :————.

10. ශාරීරික මිනුම් ׃
උස ׃ අඩි :————. අඟල් :————.
පපුව ׃ අඟල් :————.
(කාන්තා අයදුම්කරුවන් උස පමණක් ඇතුළත් කළ යුතුය.)

11. *අධ්‍යාපන සුදුසුකම් ׃*

අ.පො.ස.(සා.පෙළ)

(i) විභාගයේ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාග ප්‍රතිඵල ׃-

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස.(සා.පෙළ)

(i) විභාගයේ වර්ෂය :————.
(ii) විභාග අංකය :————.
(iii) විභාග ප්‍රතිඵල ׃-

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

12. *වෙනත් සුදුසුකම් ׃* ..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

13. කිසියම් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියේ වරදකරු වී ඇත්නම් ඒ හා සම්බන්ධ සියලු විස්තර ׃- ..........................................
..........................................................................................................................................
..........................................................................................................................................

14. *විභාග ගාස්තු ගෙවීම ׃-*

i. ගෙවන ලද මුදල :————.
ii. ගෙවූ කාර්යාලය :————.
iii. ගෙවූ දිනය :————.
iv. ලදුපත් අංකය :————.

ලදුපත එක් දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

15. *අයදුම්කරුගේ සහතිකය :*

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍යවන බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක .................. හා ............ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාග නීති රීතිවලට අනුව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද් දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

16. *අත්සන සහතික කිරීම :* (*ගැසට් නිවේදනයේ* 8.5 පරිදි විය යුතුය)

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන............................................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී ........................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සහතික කරන්න)

17. *දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියාගේ සහතිකය* (දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් සඳහා පමණි):

................................................ මයා/මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ සේවයේ නියුතු බවද, ඔහුගේ/ ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බව ද, මෙම තනතුරට අදාළ නිවේදනයේ පරිදි මෙම තනතුරට අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති බව ද, ඔහු/ඇය තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද ප්‍රකාශ කරමි. (අදාළ නොවන වචන කපා හරින්න)

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සහතික කරන්න)

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

03 - 1555/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.